# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2009 අංක 36 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 ජූලි මස 15 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ජූලි මස 17 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 1.50 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2009 අංක 36 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 ජූලි මස 15 වන දින]

එල්.ඩී.—ඕ. 13/2008.

### ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 36 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 'ආ' උපලේඛනයේ "1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනත" යන අයිතමයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අයිතමය ඇතුළත් කිරීමෙන්, ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"2006 අංක 10 දරන දේශීය ආදායම් පනත"

ප්‍රධාන ප්‍රඥප්තියේ 'ආ' උපලේඛනය සංශෝධනය කිරීම.

3. මෙහි 2 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 'ආ' උපලේඛනයට කරන ලද සංශෝධනය 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත බලාත්මක වූ දිනය වන 2006 මාර්තු මස 31 වන දිනයේ දී බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

'ආ' උපලේඛනයට කරන ලද සංශෝධනය දේශීය ආදායම් පනත බලාත්මක වූ දිනයේ සිට ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

2—PL 003890—3,490 (2009/05)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.